www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුරෝපය පුරාම දරුනු කප්පාදු පියවර

**Austerity measures throughout Europe**

**2010 මැයි 29**

සති දෙකකට පෙරාතුව, යුරෝපීය රාජ්‍ය ප්‍රධානීන් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යුරෝපය සඳහා යුරෝ බිලියන 750ක ගලවාගැනීමේ පැකේජයක් වෙනුවෙන් එකඟත්වයකට එළැඹීමෙන් පසුව විසකුරු කප්පාදු පියවරයන්ගේ නව වටයක් පිළිබඳ නිවේදනයකින් තොරව ගෙවුන එකදු දවසක්වත් නැත. බැංකු සහ යූරෝව වෙනුවෙන් විවිධාකාර ගලවාගැනීමේ වැඩසටහන්වල ප්‍රතිපලයක් ලෙස ඇතිව තිබෙන රාජ්‍ය අරමුදල්වල විශාල විවර වසා දැමීමේ මිල ගෙවීමට වැඩකරන ජනතාවට අනකර තිබේ.

උපරිම අයවැය හිඟය දල දේශීය නිෂ්පාදනයෙන් (දදේනි) සියයට 3ක සීමාවේ තබා ගැනීමට අවසර ලැබෙන, 2013 වන විට යුරෝපා සංගමයේ ස්ථාවරත්වයේ මට්ටම සපුරා ගනු පිනිස බ්‍රිතාන්‍ය සහ යුරෝපීය සංගමයේ රටවල් සිය සමස්ත අයවැය හිඟය යුරෝ බිලියන 400කින් කපා දැමිය යුතුය. මෙම දැවැන්ත මුදල් ප්‍රමානය යලි පියවා ගනු ඇත්තේ ප්‍රධාන කොටම රාජ්‍ය සේවයේ නියුතු සේවකයින්, විශ්‍රාමිකයන්, රැකියා විරහිතයන් සහ සමාජ සහන මත යැපෙන්නවුන්ගේ වියදමිනි.

වැටුප් සහ විශ්‍රාම වැටුප් කප්පාදු, සමාජ සුභසාධන වැඩපිලිවෙල් කපා හැරීම සහ වැට් බදු ඉහල දැමීම හරහා ඊලඟ වසර තුනේදී සිය අයවැය හිඟය යුරෝ බිලියන 30කින් අඩු කිරීමට සැලසුම් සකසා ඇති ග්‍රීසියේ ආදර්ශය අනුයමින් යුරෝ බිලියන 80ක කප්පාදුවක් සඳහා ස්පාඤ්ඤ ආන්ඩුව පසුගිය සතියේ තීන්දු කලේය. මෙම ඉලක්කයට ලඟාවීමට රාජ්‍ය සේවයේ රැකියා 13,000ක් කපා දැමීම හා වැටුප් සියයට 5කින් අඩු කිරීම ද විශ්‍රාම වැටුප් අත්හිටුවීම ද ක්‍රියාවට නඟනු ඇත. මීට පෙර නව දරු උපතකදී ගෙවන ලද යුරෝ 2,500ක දීමනාව කිසිදු සහනයකින් තොරව ම අහෝසි කෙරෙනු ඇත.

පෘතුගාලය සිය අයවැය හිඟය යුරෝ බිලියන 2කින් අඩු කිරීම සඳහා අනියම් සේවකයන් බඳවා ගැනීම අත්හිටුවීම, රාජ්‍ය වැටුප් කැටි කිරීම හා පවතින වැට් බද්ද ඉහල දැමීම අරඹා තිබේ.

අනියම් පදනමකින් රාජ්‍ය සේවයට බඳවාගැනීම් අත්හිටුවීම ද ඇතුලුව යුරෝ බිලියන 7.2ක හදිසි කප්පාදුවක් මෙම සතිය මුලදී බ්‍රිතාන්‍ය ආන්ඩුව නිවේදනය කලේය. එහෙත් මෙය ආරම්භය පමනි. ඊලඟ වසර හතරේදී සමස්තයක් වසයෙන් බ්‍රිතාන්‍ය අයවැය හිඟය යුරෝ බිලියන 100කින් කපා දමනු ඇත. රාජ්‍ය සේවයේ තනතුරු 300,000ක් අහෝසි කිරීම සහ රාජ්‍ය සේවයේ වැටුප් කැටිකිරීමක් මෙයට අඩංගු වෙනු ඇත.

මැයි 26වෙනි දින ඉතාලි ආන්ඩුව 2012 වසර වනවට යුරෝ බිලියන 24ක් කපාහැරීමට තුඩුදෙනු ඇති පියවර මාලාවක් නිවේදනය කලේය. එයට, රාජ්‍ය සේවයේ රැකියාවන් අවම කිරීම, වැටුප් කප්පාදු, විශ්‍රාමික වයස ඉහල දැමීම හා සුව ආරක්ෂන පද්ධතියේ කප්පාදු ඇතුලත් වේ.

ප්‍රන්සය, එහි අයවැය හිඟය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8ක සිට 2013දී සියයට 3ක් දක්වා අඩු කිරීමට සැලසුම් කරයි. මෙය සඵල කර ගනු ලබනවා ඇත්තේ විශ්‍රාම වයස දීර්ඝ කිරීමෙන්; නිවාස සහනාධාර, විරැකියා දීමනා සහ කෞතුකාගාර අරමුදල් කපා හැරීම මෙන්ම, පරිපාලන වියදම්වලින් සියයට 10ක් කපා දැමීම ද මගිනි.

ජර්මානු ආන්ඩුව දැඩි කප්පාදු පිලිවෙත් පිලිබඳව ජූනි 6 සහ 7 දිනවල තීන්දුවකට එළැඹෙනු ඇත. ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි 2016 සිට ඊනියා "නය තිරිංගය" යටතේ අලුතින් නය ගැනීම යුරෝ බිලියන 60කින් අඩු කෙරෙයි. පවුල්, ළමා, සුභසාධක හා ආබාධිත දීමනා, වාර්ෂික දීමනා හා විශ්‍රාම දීමනා වැනි සමාජ දීමනා කැපීම සාකච්ඡා වෙමින් පවතින බොහෝ පියවරයන් අතර වේ.

යුරෝපීය සංගමයේ කොමිසම දැන් යෝජනා කර ඇත්තේ යුරෝපයේ විශ්‍රාම වයස ස්ථිර ලෙසම අඛන්ඩව ඉහල දැමිය යුතු බවයි. මෙකී පියවරේ අරමුන අනාගතයේ දී කෙනෙකුගේ වැඩිහිටි ජීවිතයේ තුනෙන් පංගුවකට වඩා විශ්‍රාම දිවිය ගත නොකරන බව සහතික කිරීමය. තවදුරටත් කියතොත් මෙහි තේරුම වන්නේ විශ්‍රාමික වයස අවුරුදු 70 දක්වා ඉහල නංවන බවයි.

මිලියන ගනනක් වන කම්කරුවන් සහ තරුනයින්ට අලුතින් සම්මත කරගත් ක්‍රියාමාර්ගවල

අර්ථය වන්නේ විරැකියාව සහ ඉහවහා යන දුප්පත්කමයි. විශේෂයෙන්ම, වැඩිහිටි-දිවියේ දරිද්‍රතාව යලි වතාවක් යුරෝපයේ දැවෙන ප්‍රපංචයක් වනු ඇත. පශ්චාත්-යුදකාලීන සුභසාධක රාජ්‍යයේ කිසිවක් ඉතිරි නොවනු ඇත. එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සාමය සඳහා විද්වත් මඩුල්ලේ කානෙගී එන්ඩොව්මන්ට් ආයතනයේ අධ්‍යනයනක් නිගමනය කරන්නේ, "1940 ගනන්වලින් මෙපිටට මහජන නොසන්සුන්තාව යටපත් කිරීමේ සහ තවත් මහද්වීපික යුද්ධයකට මෙහෙයවිය හැකි ආතතීන් සමනය කිරීමේ අරමුනින් යුරෝපය පුරා පිහිටුවනු ලැබූ සුභසාධක රාජ්‍යයන්" තවදුරටත් "නොදැරියහැකි" බවයි.

එහෙත් මුදල්වල අඩුවක් නැත. සුභසාධක රාජ්‍යයන් බිඳීයාම යුක්තිසහගත කිරීමට යොදා ගනිමින් තිබෙන අයවැය හිඟයන් වූ කලී සමාජයේ පහල ස්තරයන්ගෙන් සමාජයේ ඉහල ස්තරවලට ආදායම් සහ ධනය ක්‍රමිකව යලි බෙදහැරීමෙන් ඇති වූ ප්‍රතිපලයකි. අවම වසයෙන් 1980 ගනන්වල සිට, දක්ෂිනාංශික සහ "වාම" යැයි කියාගන්නා ආන්ඩු දෙවර්ගයම ධනවතුන් උදෙසා ආදායම් සහ දේපල බදු පහත දැමූ අතර වැටුප් පහත හෙලා අඩු-වැටුප් වැඩවල නව ක්‍රමයන් නිර්මානය කලේය. මෙය, රාජ්‍ය නය ඉහල යාමේ ප්‍රමුඛ හේතුවලින් එකකි.

බංකොලොත් වීමන් වලක්වා ගැනීමට 2008 සහ 2009 යන වසරවලදී මහා බැංකුවලට ආන්ඩු විසින් ට්‍රිලියන ගනනක් මුදල් පොම්ප කිරීමේ අර්ථය වූයේ රාජ්‍ය නය තියුනු ලෙස ඉහල නැගීමයි. මෑතක දී ජර්මනියේ බුන්ඩෙස් බැංකුව ප්‍රසිද්ධ කල සංඛ්‍යා ලේඛනවලින් මෙය සනාථ කෙරින. 2008 හා 2009 වසරවලදී, ජර්මනියේ අලුත් නයවලින් සියයට 53ක ප්‍රමානයක් විවිධ මූල්‍ය ආයතන බේරාගැනීමට ගන්නා ලද පියවරවල ප්‍රතිපලයකි. මෙම වසර දෙකේදී අලුත් නය සමස්තය යුරෝ බිලියන 183කින් වැඩුනි; මූල්‍ය ආයතනවලට ආධාර කිරීමට වැයවූ මුදල යුරෝ බිලියන 98 ක් විය.

දැන්, බැංකු තමන් විසින්ම නිර්මානය කරන ලද අර්බුදය කම්කරු පන්තිය කොල්ලකෑමේ ඔවුන්ගේ වැඩපිලිවෙල උත්සන්න කිරීම පිනිස යොදාගනිමින් සිටියි. ආන්ඩු සහ යුරෝපීය සංගමය ඒවායේ පාප මිත්‍රයන් ලෙස ක්‍රියා කරයි. පසුගිය 25 දින කඩිනම් සභාවාරයකදී ජර්මානු පාර්ලිමේන්තුව යුරෝ බිලියන 148ක හිස් චෙක් පතක් නිකුත් කල විට එය පැහදිලි වූවේය. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තු කමිටු සුලු මුදල් වෙන් කිරීමක් පිලිබඳව මාස ගනනක් තිස්සේ කේවල් කරන නමුත්, බුන්ඩෙස්ටැග් [ජර්මානු පාර්ලිමේන්තුව] මුදල් ගලා යනු ඇති කොන්දේසි කවරේද හා කාටද යන්න පැහදිලි කිරීමකින් තොරව ෆෙඩරල් අයවැයෙන් අඩක් වන ක්ෂනික නය වෙන් කිරීමක් ඉල්ලුම්කල විට නිහඬව ඊට අනුමැතිය පල කලේය.

මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී පටිපාටිය යුක්ති සහගත කලේ "මූල්‍ය වෙලඳපොලවල්වල නොසන්සුන්තාව" උපුටා දක්වමිනි. පාර්ලිමේන්තුව ජනතා නියෝජනයකින් තොරවීමේ කාරනය, ආන්ඩුව හෙලත්තාඩු බහුතරයකින් පන බේරාගෙන සිටීමෙන් පමනක් වුවද පැහැදිලි වෙයි. යන්තම්වත් ප්‍රමානවත් සහායක් ලබා ගැනීම පිනිස, කෙටිකාලීන විකිනීම් තහනම් කිරීම වැනි මූල්‍ය වෙලඳපොලවලට එරෙහි ඇතැම් සංකේතාත්මක (සහ මුලුමනින්ම නිශ්ඵල) පියවර ගැනීමට එයට සිදුව තිබේ. එහෙත් එය පෙරලා, ජර්මනියේ ඒකීය ප්‍රයත්නයන් මූල්‍ය වෙලඳපොලේ නිදහස් ක්‍රියාකාරිත්වයට එල්ල කල හිතුවක්කාරී ප්‍රහාරයන් වසයෙන් සලකන වොෂිංටනය සහ ලන්ඩනයේ කෝපාවිෂ්ඨ ප්‍රතිචාරය ඇවිලුවේය.

කම්කරු පන්තියට එරෙහිව දරුනු කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දැමීමේදී යුරෝපයේ පාලක පන්තීන් මූලික වසයෙන්ම යැපෙන්නේ සමාජ ප්‍රජාතාන්ත්‍රවාදීන් හා වෘත්තීය සමිති මතය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු විසින් දරුනු කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දමමින් සිටින ග්‍රීසිය, ස්පාඤ්ඤය සහ පෘතුගාලය වැනි රටවල් හා ...

කම්කරු පන්තියට එරෙහිව දරුනු කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දැමීමේදී යුරෝපයේ පාලක පන්තීන් මූලික වසයෙන්ම යැපෙන්නේ සමාජ ප්‍රජාතාන්ත්‍රවාදීන් හා වෘත්තීය සමිති මතය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩු විසින් දරුනු කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දමමින් සිටින ග්‍රීසිය, ස්පාඤ්ඤය සහ පෘතුගාලය වේවා පූර්වයෙන් ඔවුන් ගෙනගිය වියදම්-කැපීමේ පියවර නිසා දැන් දේශපාලන වාසි නෙලාගෙන තිබෙන දක්ෂිනාංශික පක්ෂ බලයට පත්ව සිටින බ්‍රිතාන්‍ය, ප්‍රන්සය සහ ජර්මනියේ වේවා සමාජ ප්‍රජාතාන්ත්‍රවාදියෝ අපකීර්තියට පත්ව සිටිති. සෑම සිදුවීමකදී ම සමාජ ප්‍රජාතාන්ත්‍රවාදීන් නිසැකව ම කප්පාදුවලට තම සහය පල කරන්නේ "විකල්පයක් නැතැ"යි වැඩකරන ජනතාවට පවසමිනි.

කප්පාදුවලට "විකල්පයක් නැත" යන මතය දරාගෙන සිටින වෘත්තීය සමිති ඔවුන්ගේ ආන්ඩු ඒවා ක්‍රියාත්මක කිරීමේදී ඊට හවුල් වෙති. ඔවුන් ඉඳහිට විරෝධතා හා වැඩවර්ජන සංවිධානය කල ද එසේ කරන්නේ, ඕනෑම ජනතා විරෝධයක් තම අත යට තබාගැනීමට හා ඒවා තලා දැමීමේ අරමුනෙනි. ඔවුන් විරෝධතාවන් හුදකලා කරති, ඒවා පැය කීපයකට හෝ දින කීපයකට සීමා කරති, එමෙන්ම ඒවා කෙරෙහි මොනම ජාත්‍යන්තර සහයෝගිතාවක් හෝ වර්ධනය වීම වලක්වති.

මෙහිදී ඔවුහු කෙලවරක් නැති මධ්‍යම-පන්තික කන්ඩායම්වල පිටුබලය ලබති. උදාහරනයක් ලෙස, ජර්මනියේ වාම පක්ෂය, ප්‍රන්සයේ නව ධනවාදී-විරෝධී පක්ෂය හෝ ග්‍රීසියේ සිරිසා වැනි පක්ෂ අතර කවර වෙනස්කම් තිබියේ වුවත් ඒ සියල්ලටම පොදු ලක්ෂන දෙකක් තිබේ: ඔවුන් කිසි දිනෙක විවේචනය නොකරන වෘත්තීය සමිති සඳහා ඔවුන් කොන්දේසි විරහිතව සහාය දෙති. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවලට බහුතරයක් ලබා ගැනීම සඳහා උදව් කිරීමට ඔවුන් ඉදිරිපත්ව සිටියි. මේ ආකාරයෙන් කම්කරු පන්තියේ ස්වාධීන

දේශපාලන ව්‍යාපාරයක් ගොඩනගා ගැනීම වැලක්වීමට ඔවුහු උත්සහා දරති.

ගැඹුරුවන ධනවාදී අර්බුදය සහ කප්පාදු පිලිබඳව සිදුවන කේවලය, යුරෝපය තුල ආතතීන් උත්සන්න කර තිබේ. යුරෝ මුදලේ සහ යුරෝපීය සංගමයේ අනාගතය අවිනිශ්චිතය. හන්ගේරියාව, ස්ලෝවේකියා හෝ ඉතාලිය වැනි රටවල ආන්ඩු සමාජ ආතතීන්ගෙන් අවධානය වෙනතක හැරවීම පිනිස ජාතික එදිරිවාදිකම් පෝෂනය කරමින් සිටිති.

කාකොටාගන්නා ජාතික-රාජ්‍ය බවට යුරෝපය කැබිලිති වී යාම විනාශකාරී සමාජ සහ ආර්ථික ප්‍රතිවිපාකයන් ගෙන එනු ඇත. එහෙත් මහාද්වීපය එක්සත් කිරීමෙහිලා ධනපති පන්තිය ඓන්ද්‍රියවම අසමත්ය. මෙය කම්කරු පන්තියේ කර්තව්‍ය වන අතර එය ඔවුන්ගේ සාමාජ හා ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් සුරක්ෂිත කරගැනීම සමඟ නොවෙන්කලහැකි සේ බැඳී ඇත.

අර්බුදයේ උග්‍රවීම ජනතාවගේ පලල් ස්තරයන් සමාජ හා දේශපාලන අරගලයට තල්ලුකරනු ඇත. නව දේශපාලන ඉදිරිදර්ශනයක් සහ නව පක්ෂයක්, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, ගොඩනැගීම මෙය විසින් ඉල්ලා සිටියි. ධනවාදී පද්ධතිය ප්‍රතිසංස්කරනය කල නොහැක, එය පෙරලා දැමීම පමනක් ම කල හැක. විශාල බැංකු සහ සංගත සමාජ සන්තක කල යුතු අතර කම්කරු පන්තියේ ප්‍රජාතාන්ත්‍රීය පාලනය යටතේ තැබිය යුතුය. මෙය, පුද්ගල ධනපතියන්ගේ ලාභ සඳහා පෙරේතකම ඇවිලවීමට නොව, සම්පත් සමාජයේ අවශ්‍යතා ඉෂ්ටකර ගැනීමට යෙදවීම සඳහා කොන්දේසි නිර්මානය කරනු ඇත.

යුරෝපීය කම්කරු පන්තියට මෙම ඉලක්කය සපුරාගත හැකිවන්නේ යුරෝපීය එක්සත් සමාජවාදී සමූහාන්ඩු සංගමයක් සඳහා අරගලයකට එක්වීම මඟින්ම පමනි.

පීටර් ෂ්වාර්ස්

© www.wsws.org